රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 236

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 7.
1984 ජනවාරි මස 19 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා ප්‍රධානීන් වෙතයි.

**උන්හිටි තැන් අහිමි වූ රජයේ නිලධරයන් සහ රාජ්‍ය සංස්ථා සේවකයින් පුනරුත්ථාපනය කිරීම.**

01. **1983 සැප්තැම්බර් 15 දින ඉක්මවා පූර්ණ වැටුප් සහිත නිවාඩු දීර්ඝ කිරීම.**

(අ) 1983 සැප්තැම්බර් 08 වෙනි දින හා අංක: 225 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3 වෙනි ඡේදය අනුව දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා විසින් නියම කරන ලද දිනට තම සේවා ස්ථානයට සේවය සඳහා වාර්තා කිරීමට අපොහොසත්වූ උන්හිටි තැන් අහිමි වූ රජයේ නිලධරයෙකුට/සංස්ථා සේවකයෙකුට පහත සඳහන් පරිදි නිවාඩු ලබාගැනීමට අවසර දිය හැක.

(I.) 1983 පාවිච්චියට නොගත් අනියම් හෝ විවේක නිවාඩු;
(II) 1982 පාවිච්චියට නොගත් විවේක නිවාඩු;
(III) ඉතුරු නිවාඩු (ඕනෑම අවුරුදු 2 ක පාවිච්චියට නොගත් විවේක නිවාඩු)

ඉහත (II) හා (III) හි සඳහන් නිවාඩු දිය යුත්තේ එක් එක් ඇමතිවරයාගේ අභිමතය පරිදි විය යුතු අතර, එසේ ගනු ලබන සම්පූර්ණ නිවාඩුවල එකතුව 1983 දෙසැම්බර් 31 වෙනි දින නොඉක්මවිය යුතුය.

(ආ) ඉහත දැක්වෙන නිවාඩු ඉතිරිව නොමැති නිලධරයෙකු/සේවකයෙකු අදාල ඇමතිවරයාගේ අභිමතය පරිදි 1983 දෙසැම්බර් 31 දක්වා අඩ වැටුප් නිවාඩු පිට තැබිය හැක.

02. **උතුරු හා නැගෙනහිර පළාත්වල පිහිටි දිස්ත්‍රික්කවල ඇති සමාන තනතුරුවල පුරප්පාඩුවලට ස්ථාන මාරු කිරීම.**

සාමාන්‍ය රාජකාරි අඩාල නොවන පරිද්දෙන්ද, ප්‍රතිපාදිත සේවක සංඛ්‍යා සීමාව නොඉක්මවන ලෙසද, පහත සඳහන් ප්‍රතිබන්ධ අනුව, අදාල අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමතිය ඇතිව, පත්කිරීම් බලධරයාට යාපනය, මඩකලපුව, මන්නාරම, වව්නියාව, මුලතිව්, ත්‍රිකුණාමලය හා කිලිනොච්චි යන දිස්ත්‍රික්කවල ඇති සමාන තනතුරුවල පුරප්පාඩු වලට ස්ථාන මාරුකිරීම් කළ හැක.

..../2

(I) කලබල සමය තුළදී ජීවිත හානියට පත් වූ අයෙකුගේ හෝ බරපතල තුවාල ලත් අයෙකුගේ පවුලේ සාමාජිකයෙකු නැතහොත් බරපතල තුවාල ලත් අයෙක්.

(II) වැන්දඹුවක හෝ අවිවාහක කාන්තාවක්.

(III) නිශ්චල දේපලවලට හානි සිදුවූ හෝ චංචල දේපල අහිමි වූ හෝ අයෙක්.

(IV) වෙනත් අය.

03. <u>නියමිත දිනට ප්‍රතිඥාව/දිවුරුම දීමට අපොහොසත් වීම.</u>

1983 අගෝස්තු 18 දින හා අංක:222 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි සඳහන් නියමිත දිනට පෙරම, කලබල හේතුවෙන්, ප්‍රතිඥාව/දිවුරුම දීමට අපොහොසත් වී ඇත්තාවූද, ප්‍රමාදයට නිදහසට එම කරුණු දක්වන්නාවූ ද නිලධරයෙකුට/සේවකයෙකුට සේවයට පැමිණීමට අවසර දිය යුතු අතර, ඔහු නිදහසට දක්වා ඇති කරුණු සලකා රාජ්‍ය පරිපාලන ඇමැතිවරයා තීරණයක් දෙන තෙක් ඔහුට වැටුප් ගෙවිය යුතුය. 02.

Siriwardhana

(ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

ශු/217

## ආදර්ශ ආකෘතිය.

## ඉල්ලුම් පත්‍රය.

................අංක හා............ දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව රජයේ නිලධරයන් සඳහා විශේෂ අත්තිකාරම.

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම:-
2. තනතුර:-
3. කාර්යාලීය ලිපිනය:-
4. වාර්ෂික වැටුප:- (දීමනා රහිතව)
5. ඉල්ලා ඇති මුදල රු:
6. ඉල්ලුම්කරු විසින් ගණන් බලා ඇති පරිදි හානිය,රු:
7. නිවෙස්වල දේපල සඳහා හානිය සහ/හෝ එවැනි දේපල අහිමිවීයාම සහ එම හානියේ ප්‍රමාණය සනාථ කරන ලියකියවිලි.

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය:-